අභ්‍යන්තර චක්‍රලේඛ අංකය - 06/2019

# සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පෞද්ගලික සංගීත කණ්ඩායම් ලියාපදිංචි කිරීම

කලා ක්ෂේත්‍රය හා බැඳුනු නූතන සංස්කෘතිය හා සබැඳි අංගයක් වශයෙන් කණ්ඩායම් සංගීත ක්ෂේත්‍රය සුවිශේෂී ස්ථානයක් උසුලනු ලැබේ. පහත නිර්ණායකයන් සපුරාලන පෞද්ගලික සංගීත කණ්ඩායම් 2019.06.01 දින සිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ.

01. පෞද්ගලිකව පවත්වා ගෙන යනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත එළිමහනේ හෝ ඇතුළත ප්‍රසංග සඳහා පෙරදිග හෝ අපරදිග සංගීත භාණ්ඩ යොදා ගනිමින් සංගීතය සපයන කණ්ඩායමක් සංගීත කණ්ඩායමක් ලෙස සැලකේ.
02. ඇමුණුම 01 මගින් දක්වා ඇති අයදුම්පත භාවිතා කරමින් ලියාපදිංචිය සඳහා අයදුම් කළ හැකිය.
03. සංගීත කණ්ඩායමක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වලංගු සාම විනිසුරුවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. (සියළුම සාමාජිකයින්ගේ නම් ඇතුළත් විය යුතුය)
04. අදාළ සංගීත කණ්ඩායම ලියාපදිංචි කරන දිනට ආසන්න මාස 06 තුළ සිදු කරන ලද ප්‍රසංග 03ක් සඳහා වන තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුය.
05. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ හැකිවන්නේ (ඉල්ලුම්කරු) සංගීත කණ්ඩායමේ හිමිකරුට හෝ කළමණාකරුට හෝ නායකයාට පමණි.
06. ලියාපදිංචිය සඳහා සංගීත කණ්ඩායමේ සියලුම සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් වල පිටපත් අමුණා තිබිය යුතුය.
07. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සංගීත කණ්ඩායම පවත්වා ගෙන යනු ලබන ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී මඟින් ප්‍රාදේශීය ලේකම් හරහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.
08. සංගීත කණ්ඩායමේ නම, ලිපිනය, හිමිකරු, කළමණාකරු, නායකයා, හෝ සාමාජිකයින්ගේ තොරතුරු සංශෝධනය වන්නේ නම් ඒ පිළිබඳව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත දන්වා අදාළ සංශෝධනයන් සිදු කරගත යුතුය.
09. අදාළ නිර්ණායක සපුරාලන අයදුම්පත් ලියාපදිංචිය සඳහා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් අනුමැතිය ලබා දීමෙන් අනතුරුව විධිමත් ලියාපදිංචි අංකයක් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ( DCA/MB/District Code/Serial No)
10. ඉහත සියලු කරුණු පිළිබඳ අවසාන තීරණය ලබාදීමේ බලය සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ සතුවන අතර යම් සංගීත කණ්ඩායමක් ලියාපදිංචි කිරීමේ කොන්දේසි සමඟ අනනුකූලතාවයක් පළකරන බැව් අනාවරණය වුවහොත් ලියාපදිංචිය අවලංගු කිරීමේ බලය සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ සතුවේ.